සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** # සිංහල භාෂාව හා සාහිත්‍යය - I **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

01 තම දරුවන්ට අවවාද අනුශාසනා දීම **අඟින් කිරි දෙවීමක්** වැනි යැයි ඇය සිතුවා ය.

(1) භාරදූර කාර්යයක් ලෙස. (2) නිෂ්ඵල කාර්යයක් ලෙස.
(3) අං තට්ටුවෙන් කිරි ගැනීමක් ලෙස. (4) අසීරු කාර්යයක් බව.

02 ආයතන ප්‍රධානියාගේ **මුනිවත රැකීම** සේවක සේවිකාවන්ට ප්‍රහේලිකාවක් විය.

(1) කලබලකාරී වීම. (2) වෙනස්කම් කිරීම. (3) ආගම සිහි කිරීම. (4) නිශ්ශබ්දව සිටීම.

03 දේශපාලනඥයාගේ කතාවෙන් පසු ඔහුගේ **පටි කැඩුණු** බව ගමේ වැඩිහිටියෝ ප්‍රකාශ කළහ.

(1) ගෞරවය කෙලෙසුණ බව. (2) පටිය කැඩුණු බව.
(3) චරිතය වෙනස්වුණු බව. (4) නීතිය බිඳුණු බව.

- **අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04 චිරන්තන සාහිත්‍යික උක්තීන් භාවිතයට ගන්නා නූතන සාහිත්‍යකරුවා උත්සහ ගන්නේ ............................ යෙදුම් මගින් චමත්කාරයක් දක්වීමට ය.

(1) අවස්ථෝචිත. (2) ව්‍යංග්‍යාර්ථ. (3) ධ්වනිපූර්ණ. (4) පරිකල්පනය.

05 ජෝන් ගුටෙන් බ'ර්ග් මුද්‍රණ යන්ත්‍රය නිර්මාණය වීමත් සමග ම පොත්පත් ............................ ව්‍යාප්ත වන්නට විය.

(1) ප්‍රකාශනය. (2) විකාශය. (3) විකාශනය. (4) ප්‍රචාරණය.

06 තමා විඳි රසය කෙබන්දක්දැයි ප්‍රකාශ කිරීම වූ කලී හැම දෙනාට ම කළ නොහැක්කක් වන අතර ඊට ............................ අවශ්‍ය වේ.

(1) ආත්මාවබෝධය. (2) ආත්මාන්වීක්ෂණය. (3) භාවෝත්දීපනය. (4) රසවින්දනයක්.

- **අංක 07 සිට 08 තෙක් ප්‍රශ්නවල සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.**

07 (1) අවිනෂ්ඨ, එකෙණෙහි, කිහිඹියකට, පිළිබඳ.
(2) කාව්‍යෝක්ති, විස්මයාවහ, හසළත්වය, ශාස්ත්‍රීය.
(3) කතා වින්‍යාසය, සතතාභ්‍යාසය, ප්‍රතිභාව, අකශ්මිකව.
(4) ප්‍රඥාව, ආකර්ෂණීය, වර්දනය, නෙළුම් කවි.

08 (1) කෘෂ්ණ පක්ෂය, උළෙල, නිවර්තන, කුනාටු, ව්‍යවහරික විද්‍යා.
(2) කළමණාකරණය, ප්‍රතිසංස්කරණය, බාරහාර, භ්‍රමනය.
(3) පරිච්ඡේදය, ප්‍රස්ථාවනා, ජ්‍යේෂ්ඨ, ඝර්ෂණය.
(4) ප්‍රශස්ති, අධ්‍යක්ෂ, දූෂ්පෝෂණ, කනිෂ්ඨ.



EXAMRESULTS.LK

- **අංක 9 සිට 10 තෙක් ප්‍රශ්නවල අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.**

09 (1) අඹේපුස්ස, අනුරාධපුර, අලව්ව, අම්පාර. (2) කඩුවෙල, කතරගම, කන්කසන්තුරේ, කල්මුනේ.
(3) රත්නපුර, රඹුක්කන, රන්දෙණිගල, රන්ටැඹේ (4) මහනුවර, මාතලේ මීරිගම, මල්කඩුවාව.

10 (1) අමාවතුර, පූජාවලිය, පරෙවි සන්දේශය, සද්ධර්මාලංකාරය.
(2) කෝවිල, පන්සල, පල්ලිය, දේවස්ථානය.
(3) අම්මා, තාත්තා, දුව, පුතා.
(4) තානාපති, ස්ථානාධිපති, උපප්‍රධාන, අධ්‍යක්ෂ.

11 එක් එක් වචනවල මුල'කුරෙහි ඇදය, දීර්ඝ පාපිල්ල, ගයනුකිත්ත, ඇලපිල්ල යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
(1) දෙබල, මුල්ල, දූපත, නැව. (2) මාලය, මූසිල, භෞමික, හැපින්න.
(3) කැත්ත, රූපය, නෞකාව, මාලය. (4) ශාකය, දූපත, මනඃකල්පිත, කැමති.

12 පිළිවෙළින් අඝෝෂ, අක්ෂරයක්, මූර්ධජ අක්ෂරයක්, අන්තස්ථාක්ෂරයක් හා මහප්‍රාණ, අක්ෂරයක් යෙදී ඇති කාණ්ඩය තෝරන්න.
(1) බ, ෂ, උ, හ (2) ග, ඨ, ධ, ඣ (3) ක, ණ, ර, ඣ (4) ෆ, ට, ද, ඥ

13 එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් <u>නොවන</u> පද පේළිය තෝරන්න.
(1) අඹ - ජලය, කුරුල්ල - සකුණ, මහත - ස්ථූල, සෙද - ඉක්මන්
(2) මාගමක් - ස්ත්‍රියක්, තෙදින් - තේජසින්, ළෙහි - පපුවෙහි, අකුස්සෙන් - හෙණ්ඩුවෙන්
(3) උක්තීන් - කියමන්, ආකස්මිකව - අහේතුකව, ව්‍යසනය - විපත, වාල් - වහලා
(4) නරමුල් - පැසුණුකෙස්, ප්‍රසිද්ධ - පවර, නිති - නිරතුරු, යවට - මහලු

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

14 නාලාගිරි ඇත් විරීයට **හළයේ** කුමාරයා නිසා නොවන බව බුදුහු වදාළහ.
(1) පැමිණියේ (2) මුදාහැරියේ (3) මත් වී ආවේ (4) විසි කරේ

15 ජී. බී. සේනානායක මහතා ලියූ කෙටිකතාවන් තුළින් **තත්කාලීන** සමාජ තොරතුරු රැසක් හෙළි වේ.
(1) ඉතා පැරණි කාලයට අයත්. (2) වර්තමාන කාලයට ගැළපෙන සේ.
(3) ඒ කාලයට අයත්. (4) යම් තත්ත්වයකට අයත්.

16 පුද්ගලයකු තුළ නොපවත්නා **අත්‍යුත්කෘෂ්ට** ධාරණ ශක්තියක් එතුමා සතු විය.
(1) අතිරමණීය. (2) ඉතා උසස්. (3) ගරු කළ යුතු. (4) අද්විතීය සේවාවක්.

17 නිවැරදිව විසන්ධිකර ඇති වරණය තෝරන්න.
(1) සන්නිවේදනය - සන් + නිවේදනය, දුංකොළ - දුම් + කොළ
(2) මැතින් - මේ + අතින්, සිතියම් - සිති + අම්
(3) සූවසු - සූ + අසු, වටොර - වට + උර
(4) ක්‍රිස්තුත්පත්තිය - ක්‍රිස්තු + උත්පත්තිය, මල්ල - මල්ල + අ

18 මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
(1) නිපාත - ඉහි, ඔව්, පාසා, වැළි
(2) උපසර්ග - සම්, සු, පරා, අ
(3) පරරූප සන්ධිය - දුප්පත්, අස්සල, ඇද්දළ, ලග්ගල
(4) ආදේශ සන්ධිය - සමානාර්ථ, දඩයම්, මුනීන්ද්‍ර, කාලෝචිත

19 උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් අඩංගු වරණයක් නොවන්නේ,
(1) තෝ, රජතුමා, සමනලයින්, තොප (2) රීතිහු, මම, නීතින්, වැඳිරියක්
(3) දූරියක, ළමයෙකු, තොපි, මවක් (4) දරුවෙක්, නිළියක, ධීවරයින්, අපි

20 රාන්තයේ ෂූරවලි කෙටි කතාව රචනා කරන ලද්දේ,
(1) ෂ'ර්ලක්හෝම් ය. (2) ගී ද මෝපසාං ය.
(3) ර්යු නොසුකේ අකුතගාවා. (4) වින්ගීස් අයිත්මාතෝව්.

21 ඩබ්. ඒ. අබේසිංහ, හෙන්රි ජයසේන, දයානන්ද ගුණවර්ධන, මනෝ ප්‍රනාන්දු යන රචකයන්ගේ නිර්මාණයන් පිළිවෙළින් දැක්වෙන වරණය වනුයේ,

(1) වේලාසන කොක්කු ඇවිත්, නරිබෑනා, හුණුවටයේ කතාව, ලක්බිම වන සැරිය.

(2) ලක්බිම වන සැරිය, නරිබෑනා, හුණුවටයේ කතාව, වේලාසන කොක්කු ඇවිත්.

(3) වේලාසන කොක්කු ඇවිත්, ලක්බිම වන සැරිය, හුණුවටයේ කතාව, නරිබෑනා.

(4) වේලාසන කොක්කු ඇවිත්, හුණුවටයේ කතාව, නරිබෑනා, ලක්බිම වන සැරිය.

22 මොනරාගල ප්‍රදේශයේ 'දූපුතා' යන්නෙන් අදහස් කරන්නේ,

(1) තම දුවගේ පුතාට ය. (2) තම දුවගේ පුරුෂයාට ය.

(3) තම මුනුබුරාට ය. (4) තම පුතාගේ භාර්යාවට ය.

23 නංගී ද නුඹ ද පාසල් ගියෙහු. මෙහි ගියෙහු යන්න.

(1) අතීතකාල ප්‍රථම පුරුෂ ඒක වචන ක්‍රියාපදයකි.

(2) අතීතකාල මධ්‍යම පුරුෂ බහුවචන ක්‍රියාපදයකි.

(3) අතීතකාල උත්තම පුරුෂ ඒකවචන ක්‍රියාපදයකි.

(4) අතීතකාල මධ්‍යම පුරුෂ ඒක වචන ක්‍රියාපදයකි.

24 අර්ථය නිවැරදිව ගළපා ඇති වරණය වන්නේ,

A කිහිඹියකට - කුහුඹු දෙනකට. B පාපිට - පය අසල.

C ඇළව යා - ඇළ වී සිටින්න. D සබවස - සත්‍යවචන.

(1) A හා B පමණි. (2) AD හා C පමණි. (3) AB හා D පමණි. (4) CD පමණි.

25 පහත සඳහන් ව්‍යාකරණ රීති අතුරින් වැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ප්‍රශ්නවාචී යෙදුමකින් අවසන් වන වාක්‍යයක යෙදෙන කර්තෘ පදය උක්ත ස්වරූපයක් ගනී.

(2) ප්‍රාණවාචී ඒකවචන නාමපදයක් උක්තවන වාක්‍යයක ආඛ්‍යාතය ඒකවචන ස්වරූපයන් ගනී.

(3) අප්‍රාණවාචී බහුවචන නාමපදයක් උක්තවන වාක්‍යයක ආඛ්‍යාතය ඒකවචනයෙන් තබයි.

(4) තොමෝ තෙමේ යනුවෙන් උක්තවන පදයන් හි ආඛ්‍යාතය ඒකවචනයෙන් යෙදේ.

26 අම්මා සඳකි මා ඒ ලොව හිරුය රිදී ....... යන පාඨයේ අම්මා සඳකි යන්න.

(1) උපමාවකි. (2) රූපකයකි. (3) විශේෂණ පදයකි. (4) සන්ධි පදයකි.

- **27, 28 ප්‍රශ්නවල දී එක් එක් ප්‍රස්තාව පිරුළට වඩාත් ගැලපෙන අදහස තෝරන්න.**

27 නැට්ටුවා වැටුණත් අඩව්වක්ලු.

(1) දක්ෂතාවය වැඩිවන විට වැරදි සිදුවීම් අල්ප වශයෙන් ඇති වේ.

(2) විශාල වැඩ කොටසක් කරන අයට සුළු වැඩක් කිරීම ඉතා පහසු ය.

(3) දක්ෂයාගේ වැරදීමක් අන් අයට ශිල්ප ක්‍රමයකි.

(4) නැට්ටුවා වැටුණු විට එය අඩව්වක් වෙනවලු.

28 ගිලීමලෙත් ඇත දත සුද්දෝ.

(1) හොඳ පුද්ගලයන් අසළ නරක පුද්ගලයෝ සිටිති.

(2) නරක ගතිගුණ ඇති අය ළඟ ද හොඳ අය සිටිති.

(3) ගිලීමල ප්‍රදේශයේ දත සුදු පුද්ගලයෝ සිටිති.

(4) අයහපත් වැඩක් කරන විට අයහපත් පුද්ගලයෝ මුනගැසෙති.

29 පහත කියමනට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

යමෙකු කිසිදා නොදන්න නොදැක්ක යමක් තමන් අතට පත්වීම.

(1) කටුස්සාගේ කරේ රත්තරං බැන්දා වගේ. (2) අශ්වයාට අං ලැබුණා වගේ.

(3) ඌරට කිරිබත් දැක්කම ඔක්කාරෙලු. (4) වඳුරන්ට කන්නාඩි අහුවුණා වගේ.

- **අංක 30 හා 31 ප්‍රශ්නවල ඉරිඇඳි පදවල අදහසට නිවැරදි තනිවචනයක් දී ඇති වරණය තෝරන්න.**

30 විශිෂ්ට ගණයේ නිර්මාණයක් කිරීමට නම් <u>නිරන්තරයෙන් පුහුණුවීම</u> අත්‍යවශ්‍යය.

(1) ප්‍රතිපුහුණුව. (2) සතතභ්‍යාසය. (3) ප්‍රතිනිර්මාණය (4) පරිකල්පනය.

31 යම් නිර්මාණයක භාෂාව භාවික ගුණයෙන් යුතුවීම අනිවාර්ය වන අතර <u>මතුපිට අර්ථය</u> ඉක්මවා යන සැඟවුණු අර්ථයකින් ද පෝෂණය විය යුතු ය.

(1) ධ්වනිපූර්ණ. (2) වාච්‍යාර්ථය. (3) පරිකල්පනය. (4) අලංකාරවාදය.

• අංක 32 සිට 33 දක්වා ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

32 (1) වෛද්‍යවරු මේ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා අධිකරණය හමුවට යෑම මැනවි.
(2) මිනිසුන් අවංක නොවන්නේ ඇයි ?
(3) ඕතොමෝ ඉතා සෙනහසින් දරුවෝ රැකබලා ගන්නී ය.
(4) සියලු සත්ත්වයින් දුකින් මිදෙත්වා.

33 (1) අප වියරණ රීතින් අනුගමනය කළ යුතු වෙමු.
(2) තුරුහු සුළඟේ ඒ මේ අත පැද්දෙන්නට වූහ.
(3) සභාපතිනිය විසින් නවක සාමාජිකයෝ පත්කරනු ලැබී ය.
(4) ඔවුන් කවරද සාමය ළඟා කර ගනිත් ද?

34 (1) ක්‍රිකට් කණ්ඩායම අද නවසීලන්තය බලා ගමන් ගමන් ආරම්භ කරයි.
(2) ශිෂ්‍ය ශිෂ්‍යාවෝ මාසිකව නේවාසිකාගාර ගාස්තු ගෙවනු ඇත.
(3) අපි දක්ෂ නිවේදක ශිල්පීන් වෙමු.
(4) වතුසුදු ගස් පෙළ ආලෝකයෙන් බබළති.

35 (1) අයෙක් පොත් ඉතා විමසිල්ලෙන් කියවයි.
(2) පියාණෝ දරුවන් පෝෂණය කරයි.
(3) මේ පින් බලෙන් මා දෙවියෙක් හෝ බ්‍රාහ්මයෙක් වන්නෙමි.
(4) පියා හා නුඹ හා මම පුස්තකාලයට යන්නෙමු.

36 පහත සඳහන් කාව්‍යයේ තුන්වන පදය තෝරන්න.

නුඹ සා මඬුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රුක සඳ මල් කැනක සිරි ගත
...........................................................................................................
දිවගත එවි බියෙනැ'ල ළෙමිනි දස අත

(1) පුල් නිලුපුල් සම්වන් කතක වුවනත
(2) හැම ගනඳුර බොන වර නිසයුරා ගත
(3) තර පතරින් සඳ' දර තර පහර දෙත
(4) පහන් බැවින් පිටතට සස ලෙසින් වත

37 ''ඒ පනත් දෙක මොනවද මාමේ''?....... මම ඇසීමි.
මෙහි ඇතුළත් නොවූ විරාම ලක්ෂණ වනුයේ,
(1) තනි උඩු කොමාව. (2) යුගල උඩු කොමා. (3) ප්‍රශ්නාර්ථ ලකුණ. (4) තිත් පෙළ.

38 ''බල්ලා පිදුරු ගොඩට එනකොට කුරුල්ලෝ ටික ඉගිලුණා.''
(1) බල්ලා පිදුරු ගොඩට එනකොටම කුරුල්ලන් ඉගිලුණ හ.
(2) බල්ලා පිදුරු ගොඩට එනවිටම කුරුල්ලෝ ඉගිලිණ.
(3) බල්ලා පිදුරු ගොඩට එත් ම කුරුල්ලෝ ඉගිලී ගිය හ.
(4) බල්ලන් පිදුරු ගොඩට එත් ම කුරුල්ලෝ ඉගිලී ගිය හ.

39 ''රත්න දීප ජන්ම භූමි
ලංකා දීප විජය භූමි
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි......
ඉහත සඳහන් ප්‍රසිද්ධ ගීතයේ පද රචකයා වන්නේ,
(1) රත්න ශ්‍රී විජේසිංහයන් ය. (2) මහගම සේකරයන් ය.
(3) ටිබෙට් ජාතික එස් මහින්ද හිමියන් ය. (4) ගුණදාස අමරසේකරයන් ය.

40 පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.
''ලංකාව තුළ ස්වාධීන සභ්‍යත්වයක මුල් බිජුවට සිටුවන ලද්දේ දිවයිනේ ජනාවාස කිරීමට මුල් වූවා සේ සැලකෙන විජය රජු විසින් නොව පළමු වැව කර වූ පණ්ඩුකාභය රජු විසිනි.''
(1) නිදහස් ලංකාවක සංස්කෘතියේ ආරම්භය ඇති කළේ විජය රජු නොව පණ්ඩුකාභය රජු ය.
(2) ලක්දිව අනන්‍ය වූ සභ්‍යත්වයක මූලාරම්භය සිදු කළේ විජය රජු නොව පළමුවන වැව කර වූ පණ්ඩුකාභය රජුය.
(3) ලක්දිවට අනන්‍ය වූ සභ්‍යත්වයක මූලාරම්භය සටහන් වන්නේ විජය රජුගෙන් නොව පළමුවන වැව කරවූ පණ්ඩුකාභය රජුගෙනි.
(4) විජය රජු ලංකාව ජනාවාස කළත් ලංකාවේ නිදහස් සභ්‍යත්වයක ආරම්භය සිදු වූයේ පණ්ඩුකාභය රජ කර වූ පළමුවන වැව නිසා ය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- අංක **(i)** සිට **(x)** තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) අර්ධ ස්වර දෙකක් ලියන්න.

(ii) පහත වචනවල අක්ෂර වින්‍යාසය වැරදිය. එය නිවැරදි කර ලියන්න.

(අ) මහළු මිනිසා. (ආ) පිලිසකර කිරීම.

(iii) පහත වචනවලට අනුත්ත පද ලියන්න.

(අ) විද්වත්හු. (ආ) ලේකම්වරියක්.

(iv) පහත වාක්‍ය නිවැරදි කර ලියන්න.

(අ) මල්ලි ද නංගි ද මම ද පාසලට ගියෙ මි.

(ආ) දුටුගැමුණු රජතුමා දැහැමි පාලකයෙකු ලූ.

(v) පහත වාක්‍යයේ යෙදී ඇති උපසර්ග පදයක් සහ නිපාත පදයක් ලියන්න.

(අ) සුන්දර යුවතිය විරල රෝගයෙන් අසාධ්‍යව ව මිලාන වූ කුසුමක් මෙන් දිස් විය.

(vi) මිත්‍ර ධර්මය, මිතුදහම නම් පහත වචන වලට අනුරූප වචන ලියන්න.

(අ) ශිලා ලේඛනය (ආ) චන්ද්‍ර කාන්ති

(vii) පහත සඳහන් වාක්‍ය කර්ම කාරක වාක්‍ය බවට හරවන්න.

(අ) සභාපතිතුමා නව ලේකම්වරියක පත් කළේය.

(ආ) උපාසිකාව පහන් දල්වන්නී ය.

(viii) පහත සඳහන් පද විසන්ධි කරන්න.

(අ) අම්පාර (ආ) දැඟිලි

(ix) (අ) ''නටයි'' යන්නෙහි කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව ලියන්න.

(ආ) ''බලයි'' යන්නෙහි ප්‍රයෝජ්‍ය ක්‍රියාව ලියන්න.

(x) මේ ප්‍රාදේශිය ව්‍යවහාර සාමන්‍ය ව්‍යවහරයේ ඇති අන්දම ලියන්න.

(අ) මුලිච්චි වුණා. (අ) මක්කැයි. (ල. 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ස්වභාව ධර්මය අපට අගනා සේවයක් ඉටු කරනු ඇත. ස්වභාව ධර්මයට අප ආදරය කරන තරමට, ආරක්ෂා කරන තරමට එය අප වෙත බෙහෙවින් ආදරය කරනු ඇත. ස්වභාව ධර්මයට එරෙහි වුව හොත් එය ද අපට එරෙහි වනු ඇත. දැනට ලොව පුරා සිදුවෙමින් පවතින ස්වාභාවික විපත් අප ස්වභාව ධර්මයට පිටුපෑමේ අනිසි ප්‍රතිඵල විය නොහැකි ද? ලොව ඇති එකම ජෛවවිවිධත්වය ඇති ඇමසන් වැසි වනාන්තරය ගිනි ගැනීමට ඊට හොඳම නිදසුනකි. ඔබේ අදහස් දක්වමින් සුදුසු මාතෘකාවක් ද යොදා රචනයක් ලියන්න.

(ආ) රූපවාහිනිය, පරිගණක සන්නිවේදන මාධ්‍ය, ජංගම දුරකථන ප්‍රබල ලෙස ළමා සිත් ආක්‍රමණය කරමින් සිටී. එය හොඳට මෙන්ම නරකට ද හේතුවිය හැකිය. මෙම සංන්නිවේදන මාධ්‍ය ගුණාත්මක අධ්‍යාපනය සඳහා කෙසේ උපයෝගී කර ගත හැකි ද? යන්න පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(ඉ) අපේ රටට විදේශ විනිමය විශාල වශයෙන් උපයාගත හැකි සංචාරක ව්‍යාපාරය රටේ ජනවර්ගයට හිතකර මෙන්ම අහිතකර අන්දමින් බලපායි. අහිතකර තත්ත්වයන් ඉවත් කරමින් රටේ අභිමානය රැකෙන පරිදි සංචාරක ව්‍යාපාරය නංවාලීමට අවශ්‍යය. මේ පිළිබඳව අවධානය යොමු කරමින් සුදුසු මාතෘකාවක් ද යොදා රචනයක් ලියන්න.

(ඊ) උදාහිරු පෙරදිග අහසේ කිරණ විහිදුවමින් නැග එද්දී විහඟුන්ගේ නාදය දෙසවන් පිනවමින් අප අලුත් දවසකට කැඳවයි. මුනිසිරිපා පිස එන බව සැලකෙන මඳ සුළඟ ගත සිත ප්‍රාණවත් කරයි. මෙවන් මොහොතක ඔබ විල් තෙරක, කඳු මුදුනක, ගං ඉවුරක වැව් ඉස්මත්තෙක සිට දකින උදෑසන සුන්දරත්වය පිළිබඳව ඔබේ හැඟීම් කැටිකර රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. (ල. 25)

03 පහත සඳහන් ඡේදය වචන 50 - 60 අතර ප්‍රමාණයකින් සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

යම් කතාවක් කෙටි වූ පමණින් එය කෙටිකතාවක් නොවේ. ජාතක කතා, අමාවතුර, බුත්සරණ, පූජාවලිය යන ග්‍රන්ථවල දීර්ඝ නොවන කථාවල, කෙටි බීජාංකුර ඇතුළත්වන නමුදු ඒවා නූතන කෙටිකතා ගණයට අයත් වන්නේ නැත. එසේ නම් අද්‍යතන සාහිත්‍යයේ විශිෂ්ට නිර්මාණයක් වන කෙටිකතාව නවකතාවටත් වඩා ප්‍රබල මාධ්‍යයක් ලෙස ඉදිරියට පැමිණ සිටී. පුරාතන සාහිත්‍යයක් පැවැති බවට සාක්ෂි දරන ඊජිප්තුව, ග්‍රීක, රෝම චීන සාහිත්‍ය තුළ ද කෙටි වූ කතා දැකිය හැකිය.

කතා කීමේ කලාව හා ඇසීමේ පුරුද්ද ආදී වාසිකයන්ගේ යුගය තෙක් පැතිර යයි. ක්‍රි. පූ. 3000 කට පමණ පෙර පවා මෙම කතා කලාව පැවැති බවට අනුමාන කළ හැකි සාධක සොයාගෙන තිබේ. අරාබි නිසොල්ලාසයේ කතා වසර 4000 කට පමණ ඈත කාලයට දිවෙයි. පංචතන්ත්‍රය වසර 2000 කට පමණ ඈත රචනා කළ එකකි. මානව ශාස්ත්‍ර විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ ලොව බොහෝ රටවල කෙටි වූ කතා කීම, ඇසීම තිබූ බවයි. මේ අනුව පැහැදිලි වන්නේ ඉපැරණි සාහිත්‍යාංගවල බීජයන් වර්ධනය වීමෙන් නූතන කෙටිකතාව ද බිහි වූ බවයි. (ල. 10)

04 පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අද අපේ සිතියම්වල උතුරු අක්ෂාංශ හතලිස්පහ යටතේ වන ප්‍රදේශය එදා හිමෙන් වැසී තිබිණි. එය අද ''සහරා'' නමින් හැඳින්වෙන මරුකතර එදා නිල් තණපතින් හා වනපෙතින් හෙබි රමණීය, සෞම්‍ය භූමියක් ව පැවතිණ. උතුරේ ඒ හිමතට්ටු ක්‍රමයෙන් දියවන්නට විය. එවිට සෞම්‍ය පරිසරය ද මඳින් මඳ උතුරට තල්ලු විය. මේ අතර උෂ්ණාධික වෙමින් සහරාව ක්‍රමයෙන් මරුකතරක් බවට පත්විය. අවුරුදු ලක්ෂ ගණනක් තිස්සේ ඉතා සෙමින් සිදුවුණු මේ කාලගුණ විපර්යාසයන්, දේශගුණ විපර්යාසයන් අනුව බුද්ධියෙන් මෙහෙය වූ මනුෂ්‍යයෝ තව තවත් උතුරු දෙසට සංක්‍රමණය වන්නට වූහ. ඔවුහු සුවස් බිම්කඩ ඔස්සේ යුරේසියාවට (යුරෝපයත් ආසියාවත් අතර පෙදෙස) ඇතුළු වූහ.

(1) මෙහි ඔබට හමුවන ලෝකයේ ප්‍රධාන කාන්තාරය කුමක් ද?

(2) අද ඔබ හඳුනන ඒ කාන්තාරය එදා කෙබඳු වී ද?

(3) එහි විසූ මිනිසුන් තවත් උතුරට සංක්‍රමණය වූයේ ඇයි.

(4) එම ප්‍රදේශය මරුකතරක් බවට පත්වීමට කොපමණකලක් ගතවී ද?

(5) ඔවුන් ඇතුළු වූ ප්‍රදේශය කුමක් ද? (ල. 2 x 5 = 10)

05 අනුරාධපුර ගලෙන්බිඳුණුවැව පුබුදු ග්‍රාමය පවුල් 250 ක් පමණ ජීවත්වන දුෂ්කර ගම්මානයකි. අවුරුද්දේ වැඩි කාලයක් වර්ෂාව නොමැති නිසා මෙම ප්‍රදේශයේ ජනයා නිරන්තරයෙන් පානීය ජල ගැටලුවට මුහුණ දී සිටී. අපිරිසිදු ජලය පානය නිසාම වැළඳුණු රෝග වලින් පීඩා විඳින්නෝ බොහෝ ය. කුඩා දරුවන් පවා විවිධ රෝගයන්ට ලක්ව සිටීම කනගාටුවට කරුණකි. මේ නිසා එම ගමේ 'දිරිය අපි' තරුණ සංවිධානය තීරණය කළේ අනුරාධපුර සිංහ සමාජයෙන් නළ ජල සම්පාදන ව්‍යාපෘතියක් ඉල්ලා සිටින්නට ය.

ඔබ ඉහත තරුණ සංවිධානයේ ලේකම් සතිෂ් කුමාර පෙරේරා යි සිතා අනුරාධපුර සිංහ සමාජයේ සභාපති වෙත යැවිය යුතු ලිපිය සකසන්න.

(මේ සඳහා වචන 100 ක් ප්‍රමාණවත් ය.) (ල. 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

## 10 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය - III කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''ගිවිස්නා ලද යැ දේවයනි''
- (අ) මේ කාගේ ප්‍රකාශයක් ද?
- (ආ) මේ ප්‍රකාශය කා හට පවසන ලද්දක් ද?

(ii) පහත සඳහන් පද්‍යයේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙළා

- (අ) ........................................................................
- (ආ) ........................................................................

(iii) (අ) ''එකෝමත් එක රටක''
- (ආ) ''සාහිත්‍යය විද්‍යාව'' යන කෘතිවල කතුවරු පිළිවෙළින් ලියන්න.

(iv) (අ) එස්. මහින්ද හිමි කවි ලියූ තේමාවක් සඳහන් කරන්න.
- (ආ) එච්. එම් කුඩලිගම කවියා සංස්කරණය කළ කවි සඟරාවේ නම ලියන්න.

(v) ''උඹ, දූන් ඉක්මන් කරලා ගමට යන එකයි හොඳ''
- (අ) මේ ප්‍රකාශය කරන්නේ කා හට ද?
- (ආ) මේ ප්‍රකාශය ඇතුළත් කෘතියේ කතුවරයා ලියන්න.

(vi) (අ) වීරසිංහ ප්‍රතිරාජ
- (ආ) සලාවත ජයපාල යන අමාත්‍යවරු විසූ යුග පිළිවෙළින් ලියන්න.

(vii) ''ඔබ දෙදෙන මා සමග
නො ආවොත් යන්ට වේ''
- (අ) මේ ප්‍රකාශය කරන්නේ කවුරුන් ද?
- (ආ) මේ ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

(viii) (අ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට මූලාශ්‍රය වූ කෘතිය කුමක් ද?
- (ආ) චූලනී බ්‍රහ්මදත්ත රජුගේ මෑණියන්ගේ නම ලියන්න.

(ix) <u>පටන්</u> සුරිඳු දුන් උපදෙස් සිහි කොට
<u>ඉටන්</u> බෙලෙන් දුමුවෙන් ගුලි අහසට
ඉරි ඇඳි පදවලට සමාන පදය බැගින් ලියන්න.

(x) පහත නම් සඳහන් අය ජීවත් වූ රාජ්‍යයන්වල නම් ලියන්න.
- (අ) මහෞෂධ පණ්ඩිතුමා
- (ආ) කේවට්ට බමුණා (2 x 10 = 20)

02 පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
<u>රුති ලෙස</u> <u>රුපුනොද</u> බිඳ ජය ගත්තෝ
පැතිරෙන වෙණ නද බැඳුණු සිතැත්තෝ
අති'නව් ගිලිහෙන බව නොම දත්තෝ

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) පසුව මුළු කවියේ ම අර්ථය ලියන්න.

(ii) ''බෝධි සත්වයන් වහන්සේගේ යෝධයෝ බ්‍රහ්ම දත්තයන්ගේ යෝධයනට අතින් මුහුණින් උසුළු පැ නොයෙක් ප්‍රකාරයෙන් ආක්‍රෝෂ <u>පරිභව</u> බෙණෙමින් <u>ගහට</u> කරන්නා හ.

(අ) ඉරි ඇඳි පදව අර්ථය ලියන්න.
(ආ) මුළු කොටසේ ම අදහස සරල බසින් ලියන්න.

(iii) සේ රිවි බිම්බා පතළ <u>තෙද</u> බලැති මහරු
මෙන රන් ටැම්ලා නිසසල ගුණයෙන් සපිරු
මනරම් <u>යුග බා</u> දී අහස ඔසවන යුරු
නෙ විකුම් සිහ බා පෙරළුවේ ය ගල් පුවරු

(අ) ඉරිඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මෙම කවියේ සඳහන් උපමා දෙකක් ලියන්න.

(iv) <u>ජාතිය රන් විමනක්</u> වේ
<u>ආගම මිණි පහනක්</u> වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

(අ) ඉරි ඇඳි පද හඳුන්වන කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) මෙම කවියේ අර්ථය ලියන්න.

(v) ඊසාන දිග සුළඟ හා වැස්ස ද අවුරුදු දෙකක් තිස්සේ උත්සහ කොටත් ගෙයි මැටි බිත්තිවල සවිය මැඩලන්නට සමත් නොවීය. බිත්තිවල තැනින්තැන මැටි ඇදවැටීමෙන් වරිච්චි කෝටු තෙත් සුළඟට අසුවීම නිසා ඉන් මුල් ඇද දලු ලියලා රිකිලි ලා වැඩෙන්නට වන.

(අ) මෙහි විස්තර වන නිවස කාට අයත්ව තිබූවක් ද?
(ආ) මේ කරුණ හා සබැඳි අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

03 (i) ජාතිකාභිමානී හැඟීම් ඉපැදවීමටත්
(ii) චරිත සංවර්ධනයට මග පෙන්වීමටත්
එස්. මහින්ද හිමි උත්සහ දරා ඇති අයුරු ''මුනි සිරිපා සිඹිමින්නේ'' පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

<u>නැතහොත්</u>

(i) පරාර්ථකාමී චරිත හා
(ii) ආත්මාර්ථකාමී චරිත හැසිරෙන ආකාරය උම්මග්ග ජාතකයෙන් ඉස්මතු කර පෙන්වා ඇති අයුරු අදාළ කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

04 (i) අර්ථරසයත්
(ii) ශබ්දරසයත් මැනවින් ඉස්මතු කරමින් ගුත්තිල කාව්‍ය රචනා වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් ගුත්තිල වෙණනද පාඩම ඇසුරින් මේ කියමන පැහැදිලි කරන්න.

<u>නැතහොත්</u>

(අ) ජීවිතයට වටිනා උපදේශ සැපයීමත්
(ආ) ඒ සඳහා උචිත භාෂාවක් භාවිත කිරීමත් යන කරුණු ජන කවිවල කැපී පෙනෙන ලක්‍ෂණ වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් ''හානාහීය පානා අඬහැරෙන් දූනේ'' පාඩම ඇසුරින් මේ කරුණු පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

05 පුංචි මැණිකා අධිෂ්ඨානශීලී ගැමි කාන්තා චරිතයක් ලෙස බැද්දේගම නවකතාවෙන් හඳුනා ගත හැකිය. නියමිත කොටසින් උදාහරණ තුනක්වත් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

06 ගීතවත් බස්වහරක් යොදා ගනිමින් සරච්චන්ද්‍ර මහතා සිංහබාහු නාට්‍ය රසවත් කොට ඇති ආකාරය උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

07 අජීවී පරිසරයට සජීවී බවක් එක් කිරීම ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණයේ සුවිශේෂත්වයකි. උදාහරණ තුනක් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (1) | 11 - (3) | 21 - (4) | 31 - (2) |
| 2 - (4) | 12 - (3) | 22 - (2) | 32 - (2) |
| 3 - (1) | 13 - (4) | 23 - (2) | 33 - (2) |
| 4 - (3) | 14 - (2) | 24 - (3) | 34 - (1) |
| 5 - (1) | 15 - (3) | 25 - (1) | 35 - (4) |
| 6 - (2) | 16 - (2) | 26 - (2) | 36 - (3) |
| 7 - (2) | 17 - (3) | 27 - (3) | 37 - (1) |
| 8 - (4) | 18 - (3) | 28 - (2) | 38 - (3) |
| 9 - (2) | 19 - (2) | 29 - (4) | 39 - (2) |
| 10 - (3) | 20 - (4) | 30 - (2) | 40 - (2) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II කොටස

01 (i) ය, ර, ල, ව

(ii) (අ) මහලු මිනිසා (ආ) පිළිසකර කිරීම

(iii) (අ) විදවතුන් (ආ) ලේකම්වරියක

(iv) (අ) මල්ලි ද නංගි ද මම ද පාසලට ගියෙමු. (ආ) දුටුගැමුණු රජතුමා දැහැමි පාලකයෙක් වූ.

(v) උපසර්ගය - විරල, අසාධ්‍ය නිපාත - මෙන්

(vi) (අ) සෙල්ලිපිය (ආ) සඳකැළුම්

(vii) (ආ) සභාපතිතුමා විසින් වන ලේකම්වරියක් පත් කෙරිනි. / පත්කරනු ලැබුවාය.

(ආ) උපාසිකාව විසින් පහන් දල්වනු ලබයි.

(viii) (අ) අම්පාර - අඹ + පාර (ආ) දැඟිලි - දෙ + ඇඟිලි

(ix) (අ) නටද්දි (ආ) බලවයි

(x) (අ) හමුවුණා, මුනගැහීම (ආ) මොක ද? ඇයි.

02 රචනය සඳහා

| | | | |
|---|---|---|---|
| 1. | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | ලකුණු | 08 |
| 2. | සංවිධානය, නිර්මාණාත්මක භාවය ස්වීයත්වය | ලකුණු | 12 |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | ලකුණු | 05 |
| | | මුළු ලකුණු | 25 යි. |

සංලක්ෂය - වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කරන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයිමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

03 සාරාංශය - කතාවක් කෙටි වූ පමණින් කෙටි කතාව ලෙස ගිනිය නොහැක. අපේ පැරණි ග්‍රන්ථවල කෙටි වූ කතා තිබුණත් නූතන කෙටිකතාවට සම නොවේ. පැරණි සාහිත්‍යයක් තිබූ ග්‍රීසියේ, රෝමයේ ද කෙටි වූ කතා තිබිණි. කතා කිරීමේ ඇසීමේ පුරුද්ද ඉපැරණි යුගවල තිබුණ. උගත් මතය වන්නේ ලොව බොහෝ රටවල කෙටි වූ කතා ඇසීම කීම තිබුණු බවයි. මේ කතා ක්‍රමයෙන් වැඩී නූතන කෙටි කතාවට පසුබිම සැදිණි. (මේ අදහස තිබේ නම් ලකුණු ලබා දෙන්න)

(වචන 55)

| | | |
|---|---|---|
| ප්‍රධාන කරුණු | ලකුණු | 06 |
| වචන සංඛ්‍යාව | ලකුණු | 02 |
| ශිල්පීය දක්ෂතා | ලකුණු | 02 |
| | මුළු ලකුණු | 10 |

04 (1) සහරා

(2) හිමෙන් වැසී තිබිණි.

(3) සහරා ප්‍රදේශයේ සෞම්‍ය පරිසරය නැති වී මරු කතරක් වීම නිසා

(4) අවුරුදු ලක්ෂ ගණනක්

(5) යුරේෂියාව (යුරෝපයත් ආසියාවත් අතර ප්‍රදේශය) (ල. 2 x 5 = 10)

05 <u>රාජකාරි ලිපිය</u>

| | | |
|---|---|---|
| ආකෘතිය | | |
| යවන්නාගේ නම, ලිපිනය, දිනය | ල. 01 | |
| ලබන්නාගේ ලිපිනය | ල. 01 | |
| ආමන්ත්‍රණය | ල. 01 | |
| මාතෘකාව | ල. 01 | |
| තනතුර හා අත්සන | ල. 01 | |

| | |
|---|---|
| ★ ආකෘතිය | 05 |
| ★ අන්තර්ගතය | 07 |
| ★ ශිල්පීය දක්ෂතා | 03 |
| මුළු ලකුණු | 15 |

<u>වෙළඳ දැන්වීම</u>

| | | |
|---|---|---|
| ආකෘතිය | | |
| මාතෘකාව | ල. 01 | |
| පළකරන්නාගේ නම | ල. 01 | |
| පළ කරන දිනය | ල. 01 | |
| නිර්මාණාත්මක බව | ල. 02 | |

| | |
|---|---|
| ★ ආකෘතිය | 05 |
| ★ අන්තර්ගතය | 07 |
| ★ ශිල්පීය දක්ෂතාවය | 03 |
| මුළු ලකුණු | 15 |

## III කොටස

01 (i) (අ) ගිරා පෝතකයාගේ ප්‍රකාශනයකි (ආ) මහෞෂධ පඬිතුමන්ට

(ii) (අ) අනුන් ලියන් දැක තම ලියට තල තලා (ආ) දුවන මුවන් දැක නොදමව් නෙළු පලා

(iii) (අ) එච්. එම්. කුඩලිගම (ආ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

(iv) (අ) දේශාභිමානී හා ජාතිකානුරාගී කවි / බුද්ධාභි වන්දනා කවි / ළමයින් උදෙසා ලියූ කවි

(ආ) සුවඳ

(v) (අ) පුංචි මැණිකාට (ආ) ලෙනාඩ් වුල්ෆ්

(vi) (අ) කුරුණෑගල (ආ) කෝට්ටේ

(vii) (අ) සිංහබාහු (ආ) ලෙන අතහැර යාම

(viii) (අ) පාලි ජාතකට්ඨ කතාව (ආ) තලතා දේවිය

(ix) පටන් - පළමුකොට / ප්‍රථමයෙන් / මුලින් ම

ඉටන් - අධිෂ්ඨාන

(x) (අ) මියුළු නුවර / මිථිලා රාජධානිය වැනි සමාන අදහසක්

(ආ) උත්තර පංචාල නුවර

(ලකුණු 2 x 10 = 20)

02 (i) (අ) ★ රැති ලෙස - කැමති පරිදි ★ රුපුනොද - විරුද්ධවාදීන්ගේ එඩිය

(ආ) නිරතුරු රජුගේ රැකවලෙහි යෙදී සිටී. කැමති පරිදි සතුරන්ගේ එඩිය බිඳ ජයගත් පැතිරෙන වීණා නාදයෙහි බැඳුන සිත ඇත්තෝ අතින් අවි වැටෙන බව නොදත්තෝ ය.

(ii) (අ) ★ පරිභව - අපහාස ★ ගහට - හිරිහැර

(ආ) බෝධිසත්වයන්ගේ මනුෂ්‍යයෝ (මහෞෂධ පඬිතුමන්ගේ) බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයන්හට අත්වලින් හා මුහුණින් විහිළු (අවඥා) කරමින් නොයෙක් අයුරින් නින්දා අපහාස කරමින්, බනිමින් හිරිහැර කරති.

(iii) (අ) ★ තෙද - තේජස ★ රන්ටැම්බා - රන්කුළුන / රනින් කළ ස්ථම්භය
(ආ) හිරුමඬල සේ / රනින් කළ ස්ථම්භයක් සේ (කවි පදයේ ඇති පරිදිම උපමාව උපුටා ඇතත් ලකුණු දෙන්න)

(iv) (අ) රූපක
(ආ) ජාතිය නම් රනින් කළ මාලිගාවකි. එමෙන් ම ආගම මැණික්මය පහනකි. මේ ලොවෙහි එය රැක ගැනීමට ඔබට හැකි වුවොත් ඔබ සැබෑම පුතෙකි. (එය රැක ගැනීමට හැක්කේ ඔබටමය.)

(v) (අ) ආරච්චිලට
(ආ) බැද්දේගම ආරච්චි මිය ගොස් නැංචෝහාමි නිවස අතහැර ගිය විට එම නිවසට අත් වූ ඉරණම.

03 (i)
- මුනි සිරිපා සිඹිමින්නේ ...........
- නිදහස මහ මුහුක් වේ ...........
- ජාතිය රන් විමනක් වේ ..........
- ජාතික රණ දෙරණ මතේ .........

(ii)
- කරදර දහසක් හමු වී .........
- තමන් ලැබූ දිවි පෙවෙතේ ...........
- ඉටු කොට කළ යුතු යුතුකම් .........
- කාටත් හිමි පොදු දේ නම් ............
- සිනිඳු මොලොක් බව මලෙහි .........

<u>නැතහොත්</u>

(i)
- චරපුරුෂයින්ගෙන් සැබෑ තොරතුරු ගලා ඒම (විශ්වාසවන්තයින් සිටීම)
- වේදේහ රජුගේ හිත දිනා සිටීම (උදාහරණ දක්විය යුතුයි)
- ධර්ම යුද්ධය දිනීම
- කේවට්ටගේ උපායන් පැරදවීම

(ii)
- තම රජුගේ පවා අවඥාවට ලක්වීම (සියලු උපායන් පරාජය වීම)
- සේනාව කේවට්ටයන්ව අවිශ්වාස කිරීම
- ලෝබය නිසා ධර්ම යුද්ධය පැරදීම (ආදී සුදුසු උදාහරණ)

(ලකුණු 15 යි)

04 (i)
- නොදනම තමා බල ............
- තත මතු ද සින්දේ ............
- කන් කලු වෙණ නද...........
- පන්සිළු වීණා ............
- මන් මත් කරවන......... (ආදී ගැළපෙන උදාහරණ)

(ii)
- නවතා ගිගිරියේ ..........
- දිය දිය ගොස පළ කරමින්...........
- වර වෙණ නද ...........
- බැදි දන මන ...........
- ළඟ ළඟවා උනුනට ............
- දිමුතු යසස්වන්...........
- රූ රැසේ අදිනා ලෙසේ ............ (ආදී ගැළපෙන උදාහරණ)

<u>නැතහොත්</u>

(i)
- නහින දෙහින කාලෙට .............
- වරද පෙනෙන .............
- ගොඩැල්ලේ තරම...............
- රන් විමනේ ...........

(ii)
- ගසට කෙටුම ...........
- ඇස නැති දා.........
- එක් උනදාට ..........
- අඳුරු කරුවලේ ...........

(ලකුණු 15 යි)

05
- ජීවත්වීම සඳහා කුලී වැඩ කිරීම
- වනයට යමින් ආහාර සෙවීම
- පුංචි මැණිකා ස්වාමියා සොයා තංගල්ලට යාම

(ලකුණු 10 යි)

06
- ප්‍රේමවන්ත දරුවෙනි මා ............
- කිම්ද මැණියනි ඔබ මේ ..........
- රාජ කුමාරියෝ පළඳිති .............
- සිනිඳු වස්ත්‍ර මිණි අබරණ ...........

(ආදී සුදුසු උදාහරණ) (ලකුණු 10 යි)

07
- කඳු බැවුමක...........
- සැඟවෙමි එබෙමි ............
- හිරිමල් සිනා රැළි ............
- රන්තරු පිරිවරාගත් ..........

(මෙවැනි සුදුසු උදාහරණ) (ලකුණු 10 යි)